# අපල පිරිපත දුරැර සුවසෙත උදාකරවන 'සෙත් කවිය'

**මහේෂ්වර දෙවියන් විසින් නිර්මාණය කරන ලද්දාවූද ඡන්දස් ආදී අලංකාර ශාස්ත්‍රය පිළිවෙළින් අනුව මහා බ්‍රහ්මයාද සත්කුමාර බ්‍රහ්මයාද සුරගුරුද ශක්‍ර දේවේන්ද්‍රයාද අනන්ත නා රජු විසින්ද ඉන් අනතුරුව ඔවුන් වෙතින් පිංගලාචාර්යයන්වරයාද හදාරා ජනතාව වෙතට දායාද කළ බවත් මහා ඍෂිවරයාණන් අගස්ති මුණිවරයා විසින් සෙත්කවියේ අටගණ හා කාව්‍ය දෝෂ ගැනත් රස විශේෂ හා නිවැරැදි වූත් අලංකාරික ශුභ අශුභ විස්තරද ගෙනහැර දක්වන ලද බවත් සෙත්කවිය සම්බන්ධව පුරාණාචාර්යවරුන්ගේ මතය ලෙස ජ්‍යොතිෂයට අනුව සඳහන් වේ. තවද ගණ අටක් හඳුන්වා දුන් අගස්ති මුණිවරයා ඒවා ජනතාවගේ පැවැත්මට බලපවත්වන්නා වූ ජීව බලවේගයක් බව අවධාරණය කළේ යැයිද පැරැණි පොතපතෙහි සඳහන්ව ඇත.**

සෙත්කවිය ගුප්ත විද්‍යාවක් යැයි කිවහොත් එය වඩාත් නිවැරැදිය. එයට හේතුව වනුයේ එය මෙරට ජන ජීවිතය තුළ ආධ්‍යාත්මය හා බැඳී පවතින නිසාවෙනි. එය රසවින්දනය පිණිස යොදා නොගන්නා වූ ශාස්ත්‍රීය නිපුණතාවකින් පරිපූර්ණ වූ රස නිශ්පත්තිය උදෙසා නොව සකල ලෝකවාසී ජනයාගේ පිහිට පතන අයට යහපත ළඟා කරදීමත් ගුණ නිශ්පත්තිය මුල්කරගෙන සුවය, සතුට, සහනය, සමාදානය, කරුණාව, දයාව, මෛත්‍රිය මුල් කරගෙන ශබ්ද ශාස්ත්‍රානුකූලව නිර්මාණය වීමත් එයට හේතු වන්නේය.


සෙත්කවි සෑදීමේදී කවි කලාව විද්‍යාවක් බවට පත්වනුයේ අක්ෂර, ගණ, යෝනි, ගැළපීම, සීහුම් බැලීම ආදී භාෂාත්මක වූත් ජ්‍යොතිෂ විද්‍යාමය වූද අනේකවිධ නියමයන් මෙන්ම නිවැරැදි වූ භාෂාමය ක්‍රම උපායන් රැසක් මෙහි රචකයා විසින් නිර්මාණය කිරීම හරහාය.

කරදර විපත් පැමිණි විටක මෙන්ම මාරාන්තික දුක් පීඩා විඳිමින් ලෙඩ ඇඳට වැටුණු විටද කායික මෙන්ම මානසික ශක්තිය ස්ථාවර කරගැනීමට දෙවියන්ගෙන් දේව ආශීර්වාදය, රැකවරණය ඉල්ලමින් පතමින් විශ්වයේ යහපත් ශක්තීන් අවධි කර ලියන ලද සෙත්කවියේ පූර්ව සූදානම, සෙත්කවි ලියන්නාද සෙත්කවි කියන්නාද ඉන් පිහිට පතන්නාද එහි හරි වැරැද්ද විනිශ්චය කරගැනීමට අසමත් වීම තදබල ඛේදවාචකයක් වී හමාරය.

සහජ කවීත්වය නොමැති වුවත් භාෂා ශාස්ත්‍රීය දැනුම නිසියාකාරවම ප්‍රගුණ කළ යුතුමය. මූලික ජ්‍යොතිෂ දැනුම පමණක් ලබා සිට මෙම කාර්යය ඉෂ්ට සිද්ධ කිරීම එතරම් ශුභ ඵල උදාකරගැනීමට ප්‍රමාණවත් නොවන බව මා මෙහිදී සඳහන් කළ යුතුමය. සෙත්කවි රචනාවේදී සහජ කවීත්වය මෙන්ම ශාස්ත්‍රීය වශයෙන් නිවැරැදි හැදෑරීමක් කර තිබීම ඉතා වැදගත් වේ. මනා දැනුමක් අවබෝධයක් නොමැතිකම නිසා සෙත්කවි කලාව තරමක් දුරට භාවිතයෙන් බැහැරව යන බව මා ලද අත්දැකීම් මත කිව හැකිය. දැනුම බුද්ධිය හැකියාව මතින් පමණක් සෙත්කවියේ ඵල දැරීමට ප්‍රමාණවත් නොවන්නකි. තමා රචනා කරන සෙත්කවියේ ගුණ පණ ලැබෙන්නට නම් ආගමානුකූල ජීවිතයක් ගතකිරීමත්, ශ්‍රද්ධාව භක්තිය මෙන්ම දෙවියන් පිළිබඳ මනා දැනීමක්, විශ්වසනීය දේව බැඳීමක් භක්තියක් මෙන්ම උතුම් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධා භක්තියත් තිබෙන සෙත්කවි ලියන්නාද එය කියවන්නාද පිහිට පතන්නාද යන තිදෙනා තුළම මනාව පිහිටා තිබිය යුතුමය.

සෙත්කවි රචනයේදී අපි ශුභ දවස, ශුභ නැකැත, ශුභ මොහොත සෙත්කවි ලිවීමේදී අක්ෂර නිවැරැදි ලෙස ගැළපීම, ගණ ගැළපීම, යෝනි ගැළපීම, ඉන්ද්‍ර, ගුරුළු නැකැත් ශාස්ත්‍රයට අනුව සෙත්කවි ලිවීම, කාව්‍ය දෝෂකරණය ආදී මූලික කරුණු පිළිබඳ මුලින්ම අවධානය යොමුකරගෙන සෙත්කවිය රචනා කළ යුතුය. ලක්දිව පුද ලබන මූලික දෙවිවරු හා දෙවියන්ගේ දේව වරුණ සෙත්කවියෙන් ඔප්පු සිද්ධ කළයුතු ආකාරය, දෙවිවරුන්ගේ ඇල්ම බැල්ම ඇතිවන වේලාවන් යොදාගැනීම, ග්‍රහ අපල දුරලන පුද පූජා, ග්‍රහ අපල දුරලන වත්පිළිවෙත්, දෙවියන්ගේ දේව වරුණ සහ දේව බලමහිමය පිළිබඳ සෙත්කවි ලියද්දී නිවැරැදි අවබෝධයක් තිබිය යුතුමය. එවිට ඔබට ශුභ ඵල උදාවනු නියතය.

සෙත්කවියේ ඇති විශේෂත්වය වන්නේ අය අක්ෂර බන්ධන මන්ත්‍රයක් වගේ නොව එයට අභිමත කාරණාවක් හා පුද්ගලයකුට ඉතා ගැළපෙන පරිදි ශාස්ත්‍රීය නියමයන් රාශියක් අනුගමනය කරමින් ලියන ලද්දාවූ ඉතා සුවිශේෂ කාව්‍ය නිර්මාණයක් වීම නිසාය. නිවැරැදි කේන්ද්‍ර පරීක්ෂාවක් කර පිහිට පතන්නාට අපල කරන ග්‍රහයන් හා අනෙකුත් අදාළ කාරණාවන්ද හරිහැටි අවබෝධ කරගනිමින් නැකැත් බලය, යෝනි බලය, පංච පක්ෂ බලය, අක්ෂර බලය, ගණ බලය යන විශ්වයේ ශක්තීන් නිවැරැදිව හඳුනා එම ශක්තිය කවි පදවලට යොදාගනිමින් නිවැරැදිව ලියන්න මනා පළපුරුදු විශ්වසනීය සෙත්කවි රචකයෙක්ම තෝරාගැනීම ඔබ විසින් බුද්ධිමත්ව සිතාබලා කළ යුතුය. එසේනම් ඔබත් ඔබගේ අපල පිරිපත දුරු කරගෙන සුවසෙත උදාකර දෙන විශ්වයේ බලගතු ප්‍රාතිහාර්යය අත්විඳින්න සූදානම් වී සිටින්න. මෙවැනි ලිපිපෙළකින් ලබන සතියේදී මා ඔබ දැනුවත් කිරීමට සූදානම්. ඔබට සියලු යහපත උදාවේවා.







*ජ්‍යොතිර්වේදිනී පී.එම්. සංජීවී වසන්ති*
*(ජ්‍යොතිර් විද්‍යා ඩිප්ලෝමාධාරිනී / ජ්‍යොතිෂ ශිරෝමනී, ජ්‍යොතිෂ අවිශ්කාර් විශිෂ්ට ගෞරව සම්මානලාභිනී, සෙත්කවි ශාස්ත්‍ර විශාරද විශිෂ්ට ගෞරව සම්මානලාභිනී)*
*සංජීවී ජ්‍යොතිර් පියස*
*දුරකතන - 0777 130391*



# රන් පදක්කම් 30න් 16ක්ම දිනූ කොළඹ සරසවියේ හෂිනිගේ ලස්සනම දවස අවලස්සන කළ මුරුත්තෙට්ටුවේ හාමුදුරුවෝ

**කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හෂිනි රංගිකා ඇපාආරච්චි සිය උපාධිය නිමකරන්නේ එහි ඉහළම දක්ෂතා වෙනුවෙන් පිරිනැමෙන රන් පදක්කම් 30න් 16ක්ම දිනාගෙන. කොළඹ වෛද්‍ය පීඨයට ඇතුළත් වන්නේ ලංකාවේ ඉහළම Z-Score අගය ඇති සිසුන් පිරිසයි. එනයින් හෂිනිගේ මේ දක්ෂතාව සුවිශේෂ එකක්.**

උපාධි ප්‍රදානය කෙරෙන්නේ කුලපති පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් අතින්. උපාධිධාරීන්ට පදක්කම් පැලඳවීමත් උන්වහන්සේ අතින් සිදුකෙරෙනවා. එහෙත් හෂිනි කාන්තාවක වීම නිසා ඇයට සිදුවන්නේ පදක්කම් 16ම තම දෑතින් පලඳාගැනීමටයි. ඒ කියන්නේ උපාධි ප්‍රදානෝත්සවයේ වඩාත්ම වැදගත් දේ වැදගත් විදියට සිදුවන්නේ නැහැ. සරලව කිව්වොත් ඇයට ප්‍රදානය කිරීමක් මෙතැන නැහැ. ඇත්තේ හෂිනිකා තමන්ටම පුදාගැනීමේ උත්සවයක්. ඒකත් 16 වතාවක්.

වසර හතර පහක මහත් පරිශ්‍රමයක, කැපකිරීමක සාඩම්බර අග්‍රඵලය වෙනුවෙන් චරිතවත් කුලපතිවරයකු හෝ කුලපතිවරියකගේ දෑතින් මෙකී සම්මාන පැලඳවීම සිදුවූයේ නම් ඇයටත් සහෝදර ශිෂ්‍ය ප්‍රජාවටත්, විශ්වවිද්‍යාලයටත් මීට වඩා අභිමානයක් නොවන්නේද? උපකුලපති වැනි තනතුරකට මෙවැන්නන් කෙතෙක් ගැළපෙනවාද යන්න සිතීමට මෙයත් හොඳ අවස්ථාවක්.

අනෙක් අතට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මුරුත්තෙට්ටුවේ හිමියන් කුලපති ධුරයට පත්කරනු ලැබුවේ දේශපාලන දොළපිදේනියක් ලෙස බව අප සැම දන්නා කරුණක්. එසමයේ සමහර සිසුන් උන්වහන්සේගෙන් උපාධිය ලබාගැනීම පවා ප්‍රතික්ෂේප කළා.

දේශපාලන හෙංචයියෙක් මෙන්ම වෘත්තීය සමිති නායකයකුට කුලපති ධුරය පිරිනැමීම පිළිබඳ එකල පැවැති විරෝධතාව හමුවේ කියවුණේ එම ධුරයට පැවරෙන සැලකිය යුතු වැඩ රාජකාරියක් නොවන බවයි. උපාධි ප්‍රදානෝත්සවය පැවරෙන මූලිකම වගකීමක් බව කියවුණා. එයටද උන්වහන්සේ වැන්නෙක් කෙතරම් නොගැළපෙනවාද යන්න මේ උපාධි ප්‍රදානෝත්සවයෙන් පේනවා.

හිමිනමක වීම නිසා වාඩිවී සිටීම මෙන්ම සිසුවියන්ට පදක්කම් නොපැලඳවීම සිසුන්ගේ ලස්සනම දවස අවලස්සන කරනවා. ගෞරවනීය හෝ වැදගත් තෙර නමක් වූයේ නම් ඒත් කමක් නෑ. මේක ලිව්වේ බෞද්ධකමට ගහන්න නොවෙයි. පොඩ්ඩක් හිතලා බලන්න.

*මහින්ද රුබසිංහ*



**ලෝක සිතියමක කොහේවත් සලකුණු කර නැති හිමාලයේ හිම කඳු අතර සැඟවුණු අද්භූත නගරයක් ගැන ඔබ අසා තිබෙනවාද? එහි ජීවත් වන මිනිසුන් කිසිදා වයසට යන්නේ නැති බවත් පිරිසිදුම ආත්මයක් ඇති කෙනකුට මිස සාමාන්‍ය මිනිසකුට එය කිසිදා ඇසින් දැකිය නොහැකි බවත් පැරණි ජනප්‍රවාදවල කියැවෙනවා.**

බැලූබැල්මට මේක සිනමාපටයකට හෝ නවකතාවකට විතරක් සීමාවුණු කතාවක් වගේ පෙනුණත්, මේ 'ෂැම්බලා' (Shambhala) අබිරහස පිටුපස තිබෙන්නේ ඉතාමත් රසවත් ඓතිහාසික සංස්කෘතික සහ ආධ්‍යාත්මික පසුබිමක්. අද අපි සොයාබලමු මොකක්ද මේ ෂැම්බලා රාජධානියේ සැබෑ රහස කියලා...

'ෂැම්බලා' කියන්නේ ටිබෙට් බෞද්ධ මෙන්ම හින්දු සම්ප්‍රදායන් තුළ අතිශය පූජනීයත්වයෙන් සලකන ආධ්‍යාත්මික රාජධානියක්. සංස්කෘත භාෂාවට අනුව මෙහි සරල අර්ථය වන්නේ 'සාමයේ සහ නිශ්ශබ්දතාවයේ ස්ථානය' යන්නයි. හින්දු ග්‍රන්ථවලට අනුව මහා විෂ්ණු දෙවියන්ගේ දසවැනි අවතාරය වන 'කල්කි' උපත ලබන්නේද මේ පූජනීය භූමියේයි.

ටිබෙට් බෞද්ධ සම්ප්‍රදායට අනුව ෂැම්බලා කියන්නේ අපි මේ ජීවත් වන පෘථිවියේ භෞතිකව පිහිටලා තියෙන පයින් ගිහින් සොයාගත හැකි නගරයක් නෙවෙයි. එය උසස් ආධ්‍යාත්මික මානයක් දැඩි භාවනාවකින් සහ මනස දියුණු කරගැනීමකින් තොරව කිසිවකුට එහි සැබෑ ස්වභාවය දකින්න ලැබෙන්නේ නැහැ.

කාලචක්‍ර තන්ත්‍රය ෂැම්බලා පිළිබඳ ප්‍රධානතම ආඛ්‍යානය හමුවන්නේ බෞද්ධ කාලචක්‍ර තන්ත්‍රය තුළයි. එහි සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේ විසින් ෂැම්බලා රාජධානියේ 'සුචන්ද්‍ර' රජුගේ ඉල්ලීමකට අනුව මේ උතුම් ධර්මය දේශනා කර තිබෙනවා. පසුව 11 වැනි සියවසේදී පමණ මේ කාලචක්‍ර බුදුදහම ටිබෙටය වෙත ව්‍යාප්ත වී තිබෙනවා. මේ ග්‍රන්ථවල පුදුමසහගත අනාවැකියක් තියෙනවා. ඒ තමයි අනාගතයේදී මුළු ලෝකයම යුද්ධ ක්‍රෝධය සහ අන්ධකාරයෙන් පිරිලා යන කාලෙක ෂැම්බලාවේ 25 වැනි පාලකයා වන 'කල්කි රජකුමාල' (රෞද්‍ර චක්‍රින්) මහා සේනාවක් සමග පැමිණ ලෝකයේ අන්ධකාර බලවේග පරාජය කරන බව. ඉන්පසුව ලෝකයේ අලුත් 'ස්වර්ණමය යුගයක්' ආරම්භ වන බව එහි දැක්වෙනවා. කාලචක්‍ර තන්ත්‍රයේ ගණනය කිරීම්වලට අනුව මේ මහා පෙරළිය සිදුවන්නේ ක්‍රි.ව. 2424 වර්ෂයේදීයි

මේ අද්භූත නගරය සෙවීම පිටුපස ලෝකයම හොල්ලපු දේශපාලන නායකයන්ගේ අඳුරු අතීතයකුත් හැංගිලා තියෙනවා. හිට්ලර් සහ ඔහුගේ දකුණු අත වගේ හිටපු හිම්ලර් මේ ෂැම්බලා කතාව ගැන මාර විදිහට උමතු වෙලා හිටියා. 1938 වසරේදී ඔවුන් Ahnenerbe නමින් විශේෂ නාසි ගවේෂණ කණ්ඩායමක් ටිබෙටයට පිටත්කර හැරියා. ඔවුන් විශ්වාස කළේ විශ්වයේ අසීමිත බලය සැඟවුණු 'පෘථිවියේ අක්ෂය' තියෙන්නේ මේ ෂැම්බලා ගුහාවක කියලයි. නමුත් අවසානයේ ඔවුන්ට කිසිදු සාක්ෂියක් හමුවුණේ නැහැ.

රුසියානු ගවේෂකයකු වූ නිකොලායි ප්‍රිවල්ස්කි 1880 ගණන්වල කුන්ලූන් කඳුකරයේ ෂැම්බලාව සෙවීමට මහා වෙහෙසක් ගත්තා. එපමණක් නොවෙයි ඉතිහාසඥ ඇන්ඩ්‍රි ස්නාමෙන්ස්කිගේ Red Shambhala කෘතියට අනුව පැරණි සෝවියට් බොල්ෂෙවික්වරුන් පවා ටිබෙටයේ දේශපාලන විප්ලවයක් ඇති කිරීම සඳහා මේ ෂැම්බලා අනාවැකිය තමන්ගේ වාසියට පාවිච්චි කරන්න උත්සාහ කර තිබෙනවා.

විද්‍යාත්මකව හෝ පුරාවිද්‍යාත්මකව බලද්දී ෂැම්බලා කියලා නගරයක් පෘථිවිය මත පවතින බවට කිසිදු සාක්ෂියක් නැහැ. විද්‍යාඥයන් පවසන්නේ මෙය හුදෙක් සංකේතාත්මක උපමාවක් පමණක් බවයි.

චීනයේ ප්‍රධාන පුවත්පතක් වන 'චයිනා ඩේලි'හි සඳහන් වූ ලිපියකට අනුව 2004 වසරේදී පර්යේෂකයන් කණ්ඩායමක් ටිබෙටයේ 'සකුම්බුම්' ආරාමයෙන් ෂැම්බලාව පිළිබඳ ඉතා දුර්ලභ ලේඛනයක් සොයා ගත්තා. නමුත් එම ගවේෂණය අවසානයේ ඔවුන් තේරුම්ගත් දේ පර්යේෂක බ්‍රාම් මෙසේ පවසනවා.

'ෂැම්බලාවේ සැබෑ අර්ථය වෙන්නේ එය භෞතිකව පොළොව මත සෙවීම නෙවෙයි එය අපේම මනස ඇතුළේ නිර්මාණය කරගැනීමයි'

### බටහිර ලෝකය මුළා කළ 'ෂැන්ග්‍රි ලා'

ජේම්ස් හිල්ටන් ලියූ සුප්‍රකට 'ලොස්ට් හොරයිසන්' නවකතාව හරහා බටහිර ලෝකය මේ කතාව උඩුයටිකුරු කළා. ඔහු කිසිදා ආසියාවට පය නොතැබූ කෙනෙක් වුණත් ෂැම්බලා කියන වචනය වැරදියට උච්චාරණය කරමින් 'ෂැන්ග්‍රි ලා' නමින් අමරණීය මිනිසුන් වසන මනඃකල්පිත නගරයක් ඔහු ලෝකයට හඳුන්වා දුන්නා. අද වනවිට බටහිර ලෝකයේ භාවනා මධ්‍යස්ථාන හෝටල් ජාල සහ ස්පා සඳහා මේ නම බහුලව භාවිත කරන්නේ සාමයේ සංකේතයක් විදිහටයි.

අපි හැමෝම ෂැම්බලාව කඳු අතර සෙව්වට කාලචක්‍ර තන්ත්‍රයට අනුව එහි සැබෑ අර්ථය හරිම ලස්සනයි. අනාගතයේදී පැමිණෙනවා යැයි කියන 'අන්ධකාර බලවේග' කියන්නේ පිටසක්වළ ජීවීන් හෝ වෙනත් මිනිස් කොට්ඨාසයක් නෙවෙයි. මිනිස් හිත් තුළ රජ කරන අවිද්‍යාව, තණ්හාව, ක්‍රෝධය සහ ආධ්‍යාත්මික පිරිහීමයි.

ඒ අන්ධකාරය පරදා කල්කි රජු ජය ගන්නවා කියන්නේ මිනිස් සංහතියේ සාමූහික විඥානය අවදි වී ලෝකය පුරා ආදරය, කරුණාව සහ ප්‍රඥාව පැතිරී යාමයි.


එහෙනම් ෂැම්බලාව කියන්නේ කොහේවත් තියෙන නගරයක් නෙවෙයි අපේම හිත් ඇතුළේ තියෙන පිරිසිදු නිසංසල සහ ආධ්‍යාත්මික උත්තරීතර තත්ත්වයයි. අපේ හිත්වල දයාව සහ ප්‍රඥාව වර්ධනය කරගන්නා දවසට අපිට අපේම 'අභ්‍යන්තර ෂැම්බලාව' සොයාගන්න පුළුවන් වේවි.

*CHAMATH VLOGS*


## නොමැරෙන මිනිසුන් ජීවත් වෙන හිමාලයේ සැඟවුණු අරුම පුදුම නගරය



හිට්ලර් වෙනම කණ්ඩායමක් දාලා හෙව්වා





# දාහත් දාහෙන් මාසයක් ඉන්න එකද
# අලුත් ආණ්ඩුවකින් ඉල්ලුව වෙනස ?

පුළුවන්කමක් නෑ. මේ සිස්ටම් එක නිත්‍යයි. මේ සිස්ටම් එක ඇතුළේ දේශපාලකයෙක් කියන කෙනා බොහොම සාමාන්‍ය විදිහට තමන්ගේ දිවිසැරිය ගතකරමින් යනවා. ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ සැප විඳිනවා. දැන් මේ 17,000කින් ජීවත් වෙන දේශපාලකකේ, ගෙදර කට්ටිය 17,000කින් ජීවත් වෙන දේශපාලන පවුලක් මම හිතන්නේ නෑ ඇති කියලා. ඒක තමයි ඇත්ත.

හැබැයි අපේ රටේ සාමාන්‍ය මිනිහට බොහෝවිට වරප්‍රසාද අහිමි වෙනවා. ඔවුන්ට ඇත්තටම සිද්ධ වෙන්නේ මෙන්න මේ 17,000කින් ජීවත් වෙන පවුලක සාමාජිකයෙක් වෙන්න තමයි. එතකොට අපිට වාහනයක් ගන්න එක සම්බන්ධව තියෙන හීනය බොඳවෙලා යනවා. ඊළඟට වෙනත් වරප්‍රසාද සම්බන්ධව තියෙන අයිතිය අපිට නැතිවෙලා යනවා. අපිට හොඳ තරු පහේ හෝටලයකට ගිහිල්ලා රාත්‍රියක් ගත කරන්න, දවසක් දෙකක් ඉඳලා එන්න තියෙන අවස්ථාව අහිමි වෙනවා. හොඳ හෝටලයකට ගිහිල්ලා කෑම ටිකක් කන්න තියෙන අවස්ථාව අහිමි වෙනවා. අර බත් ටිකක් කාලා, ඉන්න සාමාන්‍ය මනුස්සයෙක්ගේ ජීවිතය තමයි අපිට හිමි වෙන්නේ.





ජීවන පහන් තිළිණ

මේක කවදාකවත් වෙනස් කරන්න බැරි සත්‍යතාවක්. මේ ආණ්ඩුව පත්කරද්දී අපි හිතුවා මේගොල්ලෝ සාමාන්‍ය අය, මේගොල්ලෝ මහපොළොවේ ජීවත් වෙන අය, මේගොල්ලන්ට සාමාන්‍ය මිනිසුන්ගේ හදගැස්ම තේරෙනවා. ඒ නිසා මේගොල්ලෝ සාමාන්‍ය මිනිස්සුන්ට ගැළපෙන විදිහට මේ ක්‍රමය වෙනස් කරයි කියලා.

නමුත් ඔබට දැන් පැහැදිලි ඇති වලව්වෙන් ආපු රනිල්ම තමයි මේ පට්ට දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළේ ඉන්නේ. කුරුඳුවත්තේ රනිල්ට වඩා මැදමුලනේ මහින්ද වෙනස් නෑ. කුරක්කන් සාටකය වෙනස් වුණාට, ටයි කෝට් එක නැති වුණාට මහින්ද මහින්දම තමයි. ගෝඨාභය ආවා කියලා සිස්ටම් එක වෙනස් වුණේ නෑ. ඊළඟට මේ ක්‍රමවේදය ඇතුළේ අපි හිතන අපි දකින අපි බලාපොරොත්තු වෙන ස්වර්ගය පහළ නොවන බව තඹුත්තේගමින් ආපු අනුර කුමාර දිසානායක මහත්තයා අපිට ඔප්පු කරලා පෙන්නලා ඉවරයි.

මේ ක්‍රමවේදය ඇතුළේ, මේ දේශපාලන සිස්ටම් එක ඇතුළේ බලය එහෙන් මෙහෙට මෙහෙන් එහෙට හුවමාරු කරගත්තට අපිට හැමදාම සිද්ධ වෙන්නේ ඔය 17,000කින් 18,000කින් කාලා ඇඳලා ජීවත් වෙන්න. ඒ වෙනුවෙන් අපිට ගණන් ටිකක් හදලා පෙන්නනවා. උදේට දවල්ට කාලා, ලයිට් බිල ගෙවලා, ටෙලිෆෝන් බිල ගෙවලා, වතුර බිල තියෙනවා නම් ඒකත් ගෙවලා හැන්දෑවට ටීවී එක බලලා නිදාගන්න. ඊට වඩා දෙයක් මේ ක්‍රමය ඇතුළේ සාමාන්‍ය මිනිස්සුන්ට බලාපොරොත්තු වෙන්න බෑ. ඒකේ වැදගත්ම දේ තමයි ඔබටයි මටයි බලාපොරොත්තු වෙන්න බෑ. ලොකු මිනිස්සු ඒ ගන්න ආතල් ටික ගන්නවා. ලොකු මිනිස්සු ඒ විඳින සැප විඳිනවා. දකින සිහින දකිනවා. යන ගමන් ටික යනවා. හැබැයි ප්‍රශ්නේ තියෙන්නේ අපි වගේ දුප්පත් අහිංසක සාමාන්‍ය මිනිස්සුන්ට. ඒ නිසා අපි හීන දකින එක මොහොතකට නතර කරලා, දැන් 17,000කින් ජීවත් වෙන්න පුළුවන් ක්‍රමය ගණන් හදලා ඉගෙන ගනිමු. ඊට වඩා දෙයක් ගැන හිතන්න නැතුව ඉන්න මතක තියාගන්න.



ලේකම්කමකට පෙම් බැන්දා
ආශා දහසක් රස වින්දා
නටු අග කටු මත කටුක බව දැනී
ඒනිසා මම ඉල්ලා අස්වෙමි...

# මහාචාර්ය කපිල ලේකම්කමෙන්
# ඉල්ලා අස්වුණේ ඇයි?

**'ලේකම්කමකට පෙම් බැන්දා...**
**ආශා දහසක් රස වින්දා...**
**නටු අග කටු මත කටුක බව දැනී...**
**හදවත පාරයි වේදනා..**
**ඒ නිසා මම ඉල්ලා අස්වෙමි'**

රාජ්‍ය සේවයේත්, රාජ්‍ය සේවාවට සම්බන්ධයක් ඇති වෙනත් සේවාවලත්, රාජ්‍ය සේවයට සම්බන්ධතා නැති දේශපාලන සම්බන්ධතා ඇති බොහෝ දෙනාද ලේකම් තනතුරුවලට පෙම් බඳිති. ලේකම් තනතුර විශ්වවිද්‍යාල මහාචාර්ය කෙනකුට ලැබෙන තරම් වරප්‍රසාද, වැටුප් දීමනා ආදිය නොමැති කටු ඔටුන්නක් වුවත් මහාචාර්ය කපිල පෙරේරාද ලේකම් තනතුරකට දිගු කලක් පෙම්කළ කෙනෙකි. පරිපාලන සේවයේ හෝ වෙනත් දීපව්‍යාප්ත සේවාවලට වඩා බාහිර සේවාවලින් හෝ බාහිරින්ම එන බොහෝ දෙනා ලේකම් තනතුරු සඳහා නිර්දේශ වන්නේ එක්තරා ආකාරයක දේශපාලන නිර්දේශයන්ද සමගිනි.

ම. කපිල පෙරේරා මහතා මා හඳුනා ගත්තේ රාජ්‍ය පරිපාලනේ ඉන්නා සමයේදීය.

ඒ ඔහු විද්‍යාත්මක, තාක්ෂණ සේවා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීම සඳහා එක්වූ කාලයේදීය. ඔහුගේ එම විෂයයන් පිළිබඳ තිබූ දැනුමද අද්විතීයය. විශ්වවිද්‍යාල මට්ටමේදී ඔහුට කළ හැකිව තිබූ සේවාව අතිමහත්ව තිබියදී සැලකිය යුතු මට්ටමකින් දේශපාලනයට කඩේ යෑමට හැකියාවක්ද, විවිධ වූ අනන් මනන් සඳහා කාලය ගතකිරීමේ අනිවාර්ය හැකියාවන්ද, එකකට එකක් නොගැළපෙන කටයුතු බැලන්ස් කරගෙන යාමේ කුසලතාවන්ද, විද්‍යාත්මක හා තාක්ෂණ නොවූ භාවිතාවන් හා කළමනාකරණ ක්‍රමෝපායන් භාවිත වන ලංකාවේ අමාත්‍යාංශයක ලේකම්කමක් ම. කපිල ලබාගත්තේ මොන කෙහෙල්මලකටදැයි මට හොඳටම හිතුණේ ඔහු අධ්‍යාපන ලේකම් ලෙස පත්වූ කාලයේදීය.

ඒ කාලයේ ගෝඨාභයගේ වියත් මගක්ම නොවූ 'වියත් මග' ලෝකයාට පෙන්වීමට කපිල හා ඔහුගේ මහාචාර්යකම හේතුභූත වුවත් මට නම් හිතුණේ ම. කපිල අමාත්‍යාංශයක ලේකම් කෙනකුට වඩා විශ්වවිද්‍යාලයට වටිනා සම්පතක් බවයි.

අධ්‍යාපනයට පෙම්බැඳ, ඒ ආයතන ව්‍යුහය අරක්ගත් දේශපාලනමය වූ වෘත්තීය සමිති මාෆියාවෙන්ද පාඩම් ඉගෙන මේ ආණ්ඩුවේත් ලේකම් තනතුරකට පෙම් බැඳීම තව දුරටත් ම. කපිලගේ දේශපාලනමය සබඳතාවන්ද හෙළිකරවීය. එහෙම නැතිවුණත් රටේ ලෝකෙ එහෙම කතා කරන්නේ ලංකාවේ දේශපාලන හා පරිපාලන යථාර්ථය නෙගටිව් ලෙස සමාජගතව ඇති නිසාය.

දැනට ලංකාවේ ක්‍රියාත්මක වෙන ආණ්ඩුකරණය අනුව අමාත්‍යාංශයක ලේකම් තනතුර ගතානුගතික පරිපාලන තනතුරකි. ලේකම්වරු හඳුනාගැනීම සඳහා කිසිදු විද්‍යාත්මක මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් පොඩියට හෝ භාවිත නොවේ.

ලේකම් තනතුරේ පොඩි වූ ලොකුකමක් ඇති නිසා බොහෝ දෙනා ඒවාට පෙම් බඳිති. ඒවායේ නටු අග කටු ඇති බව නොදැනී ඒවා බදාගෙන ම. කපිල වගේ හදවත පාරාගනිති. අන්තිමේදී වෙන කතාවක් දමා ඉල්ලා ඉස්වෙති.

ජනාධිපති ලේකම් සිට වෙනත් අමාත්‍යාංශ ලේකම් තනතුරුත්, රටේ ඉහළ පරිපාලන හා කළමනාකරණ තනතුරුත් ටෙන්ඩර් කළ යුතු බවට (සුදුස්සන් තෝරන දියුණු රටවල භාවිත වන ක්‍රමයක්) මා දීර්ඝකාලීනව හඬක් නගන කෙනෙකි.

එවැනි තනතුරු සඳහා ආචාර්ය, මහාචාර්ය පට්ටම්වලට වඩා හැකියා කුසලතා විෂය දැනුම පදනම් කරගත් වැඩේ අනාගන්නේ නැතුව ආණ්ඩුව කරගෙන යාමට උදව් කළ හැකි රාජ්‍ය කළමනාකරණයක් අවශ්‍ය වන්නේ ආණ්ඩුවේම හොඳටය.

*ජිනසිරි දඩල්ලගේ*
*(පුන්සිරි සොයිසාගේ 'සෙව්වන්දියකට පෙම් බැන්දා' ගීතය ඇසුරෙනි.)*



# ටෝස්ට්මාස්ටර්ස් වාර්ෂික සමුළුව ෂැංග්‍රිලාවේ

දිස්ත්‍රික් 82 ජාත්‍යන්තර ටෝස්ට්මාස්ටර් සමූහයේ ඔවුන්ගේ ප්‍රධානතම වාර්ෂික සමුළුව වන Ovation 2026, මැයි 16 සහ 17 යන දිනවලදී කොළඹ ෂැංග්‍රිලා (Shangri-La) හෝටලයේදී සාර්ථකව පැවැත්විය. Tides of Transformation යන තේමාව යටතේ පැවැත්වුණු මෙම දෙදින සමුළුව සඳහා ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින සන්නිවේදකයන්, නායකයන්, වෘත්තිකයන්, ව්‍යවසායකයන්, අධ්‍යාපනඥයන් ඇතුළු පුද්ගලයන් රැසක් එක්ව සිටියහ.

මේ සඳහා සහභාගි වූවන් මෙම සමුළුව පිළිබඳ විස්තර කළේ මෑත වසරවලදී දුටු වඩාත්ම ශක්තිමත් සහ උද්‍යෝගිමත් හමුවක් බවයි.

ගෝලීය වශයෙන් ඉහළම කාර්යසාධනයක් සහිත දිස්ත්‍රික් 82 ජාත්‍යන්තර ටෝස්ට්මාස්ටර්ස් සමූහය ශ්‍රී ලංකාව, මාලදිවයින සහ බ්‍රිතාන්‍ය ඉන්දියානු සාගර කලාපය නියෝජනය කරනු ලබයි.

DTM මාරියෝ ද සිල්වා මහතාගේ ප්‍රධාන සංවිධායකත්වයෙන් පැවැත්වුණු Ovation 2026 සමුළුව සඳහා ප්‍රධාන තේමාව වූයේ සන්නිවේදනය, පුද්ගලික වර්ධනය සහ නායකත්වයේ විශිෂ්ටත්වය යන්නයි.

# කෘෂිකර්මයේ දියුණුවට ලංකා කොමර්ෂල් ට්‍රේඩින් ට්‍රැක්ටර් ගියර්බොක්ස් දෙයි


ලංකා කොමර්ෂල් ට්‍රේඩින් පුද්ගලික සමාගම (LCT) මගින් රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දියුණුවට දායක වීමේ අරමුණින් විශේෂ දායකත්ව වැඩසටහනක් ආරම්භ කර ඇත. ඒ අනුව, කෘෂිකාර්මික ඉංජිනේරු පාඨමාලා පැවැත්වෙන ආයතන වෙත නවීන තාක්ෂණයෙන් යුක්ත සිව් රෝද ට්‍රැක්ටර් ගියර් බොක්ස් නොමිලේ පරිත්‍යාග කිරීම 2026 අප්‍රේල් 29 දින ආරම්භ විය.

මෙම ගියර් පද්ධතිය 12 × 12 වේග පරාසයකින් සමන්විත වන අතර Synchromesh හා Synchro Shuttle තාක්ෂණයන් යටතේ ක්‍රියාත්මක වේ. මෙම නවීන ගියර් පද්ධති හරහා යන්ත්‍රයේ ගියර් මාරු කිරීම සුමටව සහ කාර්යක්ෂමව සිදුකිරීමට හැකියාව ලැබේ.

මෙම වැඩසටහන යටතේ, කොළඹ නාවල පිහිටි විවෘත විශ්වවිද්‍යාලය, මාලබේ පිහිටි CINEC Campus,




රත්මලාන පිහිටි කටුනායක ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) සහ හෝමාගම තාක්ෂණික විද්‍යාලය යන ආයතන වෙත ට්‍රැක්ටර් ගියර්බොක්ස් පරිත්‍යාග කිරීම සිදුකෙරිණි.



# DIMO ශක්තිය BESS වෙළෙඳපළට

DIMO හි බලශක්ති අංශය වන DIMO Energy, සිය DIMO Solar සන්නාමය යටතේ, සූර්ය බලශක්ති විසඳුම් කාර්මික හා වාණිජ යෙදුම්වලින් ඔබ්බට ගෙනයමින් දැන් නිවාස සඳහා ද විසඳුම් ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන Battery Energy Storage Systems (BESS) වෙළෙඳපළටද පිවිසී ඇත. DIMO සමාගම, සූර්ය බලශක්තිය සහ BESS ඒකාබද්ධ කළ විසඳුම් හඳුන්වා දෙමින් මෙම පියවර තබා ඇත්තේ, නිවාස සහ ව්‍යාපාර සඳහා විශ්වාසදායක සහ ස්වාධීන බලශක්ති විසඳුම් සඳහා වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමක් වශයෙනි.

මෙම ව්‍යාප්තිය සිදුවන්නේ, ගෝලීය සහ දේශීය වශයෙන් බලශක්ති ගබඩා කිරීමේ වැදගත්කම ඉහළ යමින් පවතින අවස්ථාවකය. විදුලි ජාල සීමා, බලශක්ති පිරිවැය ඉහළ යාම සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය වේගයෙන් වර්ධනය වීමත් සමග, බැටරි මත පදනම් වූ බලශක්ති ගබඩා පද්ධති ශ්‍රී ලංකාවේ බලශක්ති පරිවර්තනයේ අත්‍යාවශ්‍ය කොටසක් වනු ඇතැයි කර්මාන්ත විශ්ලේෂකයන් පෙන්වා දෙනු ලබයි. එමගින් විදුලි ජාල ස්ථාවරතාව වැඩිදියුණු කිරීම සහ සූර්ය බලශක්තියේ ස්වයං පරිභෝජනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.



# ඇඟලුම් අපනයනකරුවන්ගෙන් පෙරළිකාර යෝජනාවක්

ශ්‍රී ලංකා කලාපීය ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමය (SLCGE)හි උසස් මට්ටමේ නියෝජිත පිරිසක්, කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය Chathuranga Abeysinghe මහතා හමුවී SLCGE Design Hub පිහිටුවීම සඳහා වන උපායමාර්ගික යෝජනාව නිල වශයෙන් භාරදුන්හ.

මෙම නියෝජිත පිරිස SLCGE සභාපති Nishantha Bakmeege මහතාගේ නායකත්වයෙන් සමන්විත වූ අතර සංගමයේ නිලධාරීන් වන Jeremy Enas, Menuka Gunawardana සහ Shehan Olegasageram යන මහත්වරු ද සහභාගි විය. යෝජිත SLCGE Design Hub ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයට අලුත්ම සහ ප්‍රථම වරට ක්‍රියාත්මක වන පුරෝගාමී වැඩසටහනක් ලෙස සැලකේ. මෙම සංකල්පය මගින් SME ඇඟලුම් නිෂ්පාදකයන්ගේ කුසලතා, නිර්මාණාත්මකභාවය සහ පුළුල් නිෂ්පාදන පරාසය එකම මධ්‍යස්ථානයක් තුළ ප්‍රදර්ශනය කිරීම සඳහා ඒකාබද්ධ වේදිකාවක් නිර්මාණය කිරීමට අදහස් කරයි. මෙම මධ්‍යස්ථානය විදේශීය ඇඟලුම් ගැනුම්කරුවන් සඳහා එක් ස්ථානයකින් සියලු සේවාවන් ලබාගත හැකි one stop destination එකක් ලෙස ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇත.



# VOLKSWAGEN බත්තරමුල්ලට

ශ්‍රී ලංකාවේ Volkswagen මගී වාහන සඳහා නිල බලයලත් ආනයනකරු වන Continental Cars & Commercials Pvt Ltd සමාගම, 2026 මැයි 29 වැනි දින Battaramulla, Pannipitiya Road අංක 1035 හි පිහිටි සිය නවීනතම Volkswagen ප්‍රදර්ශනාගාරය සහ සේවා මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කළේය.

මෙම නව Volkswagen පහසුකම ශ්‍රී ලංකාවේ Volkswagen සන්නාමයේ ව්‍යාප්ති ගමනේ වැදගත් සන්ධිස්ථානයක් වන අතර, ලෝක මට්ටමේ මෝටර් රථ අත්දැකීම්, උසස් පාරිභෝගික සේවාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල අලෙවියෙන් පසු සේවාවන් සැපයීමට Continental Cars & Commercials දක්වන කැපවීම තවදුරටත් තහවුරු කරයි.

Volkswagenහි ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සංවර්ධනය කර ඇති මෙම නව පහසුකම, උසස් ප්‍රදර්ශනාගාර අත්දැකීම්, නවීන සේවා පහසුකම්, පාරිභෝගික සම්බන්ධතා අවකාශ සහ විශේෂිත තාක්ෂණික යටිතල පහසුකම් එකම ස්ථානයකින් සපයයි.

# EVOLUTION AUTO වෙතින් XPENG G6




විද්‍යුත් මෝටර් රථ ක්ෂේත්‍රයේ නව යුගයක්

ශ්‍රී ලංකාවේ XPENG සන්නාමයේ නිල බෙදාහරින්නා වන Evolution Auto (Pvt) Ltd විසින් නවතම XPENG G6 විදුලි SUV රථය 2026 මැයි 22 වැනිදා කොළඹ 05 හි පිහිටි Evolution Auto ප්‍රදර්ශනාගාරයේදී නිල වශයෙන් එළිදක්වන ලදී. මෙම හඳුන්වාදීම ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන විදුලි මෝටර් රථ වෙළෙඳපොළේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ. මෙම උත්සවයට මාධ්‍යවේදීන්, කර්මාන්ත නියෝජිතයන් සහ ආරාධිත අමුත්තන් එක්වූ අතර, XPENG G6 රථය නිල වශයෙන් එළිදැක්වීමත්, එය සජීවීව දැකබලාගැනීමටත්, ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු දැනගැනීමටත්, ධාවන පරීක්ෂාවක් (test drives) අත්දැකීමක් ලබාගැනීමටත් පැමිණි සිටි පිරිසට අවස්ථාව ලැබුණි. XPENG G6 හඳුන්වාදීම සිදුවන්නේ ශ්‍රී ලංකාවේ විදුලි මෝටර් රථ වෙළෙඳපොළ සඳහා ඉතා වැදගත් අවස්ථාවකදීය. විදුලි මෝටර් රථ සඳහා ජනතා උනන්දුව ඉහළ යමින් තිබුණද, එක් ආරෝපණයකින් ගමන් කළ හැකි දුර, උසස් මට්ටමේ විද්‍යුත් රථවල හිඟය සහ අලෙවියෙන් පසු සේවා පිළිබඳ ගැටලු වෙළෙඳපොළ තුළ පැවැතිණි. XPENG G6 එම ගැටලු සියල්ලට විසඳුමක් ලෙස හඳුන්වා දී ඇත.

# සංගීතයේ අලුත් පිටුවක් ආදිත්‍ය නාරායන සංඛ දිනෙත් එකතු වෙයි



දකුණු ආසියානු විනෝදාස්වාද ක්ෂේත්‍රයේ පෙරළිකාර සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, ඉන්දිය සංගීත ලොවේ සුපිරි තරුවක් වන ආදිත්‍ය නාරායන සහ ශ්‍රී ලංකාවේ ජනාදරයට පත් නව පරපුරේ ගායන ශිල්පී සංඛ දිනෙත් සුසංයෝගයෙන්, ලොව වටා දිගහැරෙන දැවැන්ත සංගීත ප්‍රසංග මාලාවක් පිළිබඳ පසුගියදා කොළඹදී නිල වශයෙන් ප්‍රකාශයට පත්කෙරිණි.

රටවල් සහ භූගෝලීය සීමාවන් අතික්‍රමණය කරමින්, දකුණු ආසියානු සංගීතයේ නිම්වළලු පුළුල් කරන මෙම ප්‍රසංග මාලාව පිළිබඳ නිල දැනුම් දීමේ උත්සවය, Cinnamon Life at City of Dreams හෝටලයේ Gatz ශාලාවේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. ශ්‍රී ලංකාව සහ ජපානය කේන්ද්‍රීය රටවල් බවට පත්කරමින්, ජාත්‍යන්තර සංගීත ලෝලීන් වෙත පෙරදිග හා දකුණු ආසියානු සංගීතයේ සුසංයෝගය රැගෙන යන දැවැන්ත සංගීත චාරිකාවක් සඳහා ජාත්‍යන්තර සංගීතමය සහයෝගිතාවක් ගොඩනැගුණු ප්‍රථම අවස්ථාව මෙය වේ.

# තරු පොකුරකට දුන් එළිය අවුරුදු 42දී නිවා දැමූ තනි තරුව

**1989 ජූලි 31 වැනිදා රාත්‍රී 8.30ට පමණ හෝමාගම ඩයස් පෙදෙසේ පිහිටි ඒ නිහඬ නිවසේ සාලයට කඩාවැදුණු සන්නද්ධ තරුණයන් පිරිසකගේ රළු හඬින් මුළු පරිසරයම ගල්ගැසී ගියේය. ඒ අණකිරීම නිකුත් වූයේ කාටද? මුළු දේශයක්ම අලුත් දවසකට අවදි කළ ශනිදා සාදය වැඩසටහනින් රටම හිනැස්සූ 'ආදරයේ උල්පත වූ අම්මා' වැනි අමරණීය ගීත ලියූ සිංහල සන්නිවේදනයේ සහ ගීත සාහිත්‍යයේ අසහාය සලකුණ වූ සමරවීර මුදලිගේ දොන් ප්‍රේමකීර්ති ද අල්විස් හටය.**

තමන්ගේ ජීවිතයට දැඩි තර්ජන ඇති බව ඔහු හොඳින් දැන සිටියේය. කැරැලිකරුවන්ගෙන් විවිධ බලපෑම් එල්ලවී තිබිණි. එහෙත් ප්‍රගතිශීලී දේශපාලන අදහස් දැරූ ඔහු ඒ තර්ජන බැරෑරුම් කොට නොගත්තේය.

'මට මොනවා කරන්නද? මම කාටවත් වෛර කරලා නැහැනේ? මම හැමෝටම ආදරය කරපු මිනිහෙක්...' යැයි නිතර පැවැසූ මේ මහා කලාකරුවා එදා රෑ මාරයා තමන් සොයා පැමිණි බව වටහාගෙන පසුපස දොරින් පැන යෑමට උත්සාහ කළේය.

ප්‍රශ්න කරලා විතරක් එවන්නම් කියා ඔහුගේ බිරිඳ වූ නිර්මලා ඉදිරියේ පොරොන්දු වූ ඒ සන්නද්ධ තරුණයෝ ප්‍රේමකීර්තිව නිවසින් පිටතට ඇදගෙන ගියහ. ඉන්පසු නිවසේ සිට මීටර් දෙසියයක් පමණ ඈතින් පිහිටි පාළු බිම්කඩක වෙඩිතබා ඔහුව ඝාතනය කළහ.

මුළු රටක සවන් සැනසූ ඒ මිහිරි, ආකර්ෂණීය හඬ සදහටම නිහඬ වූයේ එලෙසිනි. වයස අවුරුදු 42ක් වැනි කෙටි ආයු කාලයකදී තම නිර්මාණ ජීවිතයේ උපරිම පරිණත තලයේ සිටි ඒ අසිරිමත් කලාකරුවා දේශයට අහිමි විය. ඔහුගේ ලේන්සුවෙන් වැසුණු වෙඩි වැදුණු නිශ්චල දේහය පසුදා උදෑසන සොයාගනු ලැබූ විට මුළු රටම භීෂණයෙන් හා ශෝකයෙන් වෙළී ගොස් තිබිණි.

මරදානේ දුම්රිය සේවකයකු වූ සීමන් ද අල්විස් මහතාට අවශ්‍ය වූයේ තමන්ගේ දෙවැනි පුත්‍රයා වූ ප්‍රේමකීර්තිව දුම්රිය දෙපාර්තමේන්තුවේ ස්ථාවර රැකියාවකට යැවීමටය. නමුත් මරදාන මාලිගාකන්ද මහා විද්‍යාලයෙන්ද පසුව කොළඹ ආනන්ද විද්‍යාලයෙන්ද අධ්‍යාපනය ලැබූ ප්‍රේමකීර්තිගේ සිත ඇදී ගියේ දුම්රිය පීලි දිගේ නොව සන්නිවේදනයේ සහ කලා ලෝකයේ අසිරිමත් මාවත් දිගේය.

ආනන්ද විද්‍යාලයේ ඉගෙනුම ලබන කාලයේදීම 'ධම්ම ජයන්ති' පාසල් පුවත්පතේ සම කර්තෘවරයකු ලෙස කටයුතු කළ ඔහු 1965 දී 'ආනන්ද' සඟරාව සම්පාදනය කිරීමටද දායක විය.

1961දී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගායකයකු වීමට පැවැති පරීක්ෂණයෙන් ඔහු අසමත් විය. තනුවට ගායනා කිරීමට වඩා ඔහුගේ සැබෑ දක්ෂතාව තිබුණේ හඬ හැසිරවීමේ සහ වචන භාවිතයේ බව එකල ගුවන්විදුලියේ සිටි ප්‍රවීණයෝ මුලදී හඳුනා නොගත්හ. හැබැයි පසුව කරුණාරත්න අබේසේකරයන් වැනි දැවැන්තයන්ගේ ඇස ගැටුණු ඔහුගේ සුවිශේෂ කථන හැකියාව නිසා 'ළමා පිටිය' සහ 'ළමා මණ්ඩපය' වැනි වැඩසටහන් සඳහා සම්බන්ධ වීමට ඔහුට අවස්ථාව ලැබිණි.

1966දී 'විසිතුර' සඟරාවේ විශේෂාංග ලේඛකයකු ලෙස පුවත්පත් කලාවට නිල වශයෙන් පිවිසි ප්‍රේමකීර්ති 1967 දෙසැම්බර් 17 වැනිදා ලංකා ගුවන් විදුලියට බාහිර නිවේදකයකු ලෙස සම්බන්ධ විය. එතැනින් ඇරඹුණු ඒ සන්නිවේදන චාරිකාව 1971දී ස්ථාවර නිවේදකයකු සහ සහායක වැඩසටහන් නිෂ්පාදකවරයකු දක්වා වර්ධනය විය.

ඔහුගේ සුවිශේෂ ඉදිරිපත් කිරීමේ රටාව නිසාම 'සොඳුරු සෙවණ', 'සැරිසර පුවත් සඟරාව' සහ 'ශනිදා සාදය' වැනි වැඩසටහන් එකල ලාංකේය ගුවන්විදුලි කලාව උඩුයටිකුරු කළේය. ශ්‍රී ලංකාවට රූපවාහිනිය පැමිණීමත් සමග ජාතික රූපවාහිනියේ 'අඳුන', 'ශනිදා ආයුබෝවන්' සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ 'සම්පත් රේඛා' වැඩසටහන් ඔස්සේ ඔහු මෙරට සෑම නිවසකම ආලින්දයේ සමීපතම සහ ප්‍රියතම මිතුරා බවට පත්විය.

ප්‍රේමකීර්ති ද අල්විස් යනු සාම්ප්‍රදායික නීතිරීතිවලට හෝ දැඩි ශාස්ත්‍රීය රාමු තුළ කොටු වූ ගීත රචකයකු නොවේ. ප්‍රකට ප්‍රවීණ ගීත රචක රත්න ශ්‍රී විජේසිංහයන් වරක් පෙන්වා දුන් පරිදි විචාරකයෝ ඔහු හැඳින්වූයේ 'සිංහල සංගීතයේ අසහාය කවියා' ලෙසිනි.

ඔහුට ගීතයක් ලිවීමට නිස්කලංක පරිසරයක් පැය ගණන් හෝ දින ගණන් අවශ්‍ය නොවීය. හිස් සිගරට් පැකට්ටුවක පිටුපස කොළ කැබැල්ලක බස් රථයක ටිකට් පතක වුවද ක්ෂණිකව අතිශය ගැඹුරු පද පෙළ ලිවීමට ඔහුට සහජ හැකියාවක් තිබිණි.

1969දී රූපා ඉන්දුමතී සහ මල්කාන්ති නන්දසිරි වෙනුවෙන් 'හද පුද අසුනේ සෙනෙහස බැඳුණේ' ගීතය ලියමින් ඇරඹි ඒ ගීත ප්‍රබන්ධ මාවත පසුව චිත්‍රපට 150කට අධික සංඛ්‍යාවක ගීත ඇතුළුව ගීත සිය ගණනක් දක්වා විහිදී ගියේය. මොහිදීන් බෙග්, මාලනී බුලත්සිංහල, මිල්ටන් මල්ලවාරච්චි, ජේ.ඒ. මිල්ටන් පෙරේරා, මර්වින් පෙරේරා, වික්ටර් රත්නායක, ෆ්‍රෙඩී සිල්වා සහ ප්‍රියා සූරියසේන වැනි මෙරට අග්‍රගණ්‍ය ගායක ගායිකාවන් රැසක් ගායනා කළේ ප්‍රේමකීර්තිගේ ඒ අමරණීය පදපෙළයි.

'හෙට දවසේ අප දෙදෙනා...' (ප්‍රියා සූරියසේන)

මෙම ගීතයේ උපත පිළිබඳ රසවත් ජනප්‍රවාදයක් සමාජගත වී තිබුණද පසුව ප්‍රියා සූරියසේන මහතා එහි සැබෑව පැහැදිලි කළේය. ගුවන් විදුලි වැඩසටහනක් සඳහා ඉක්මනින් ගීතයක් අවශ්‍ය වූ අවස්ථාවකදී ප්‍රියා සූරියසේන හට ප්‍රවීණ නිවේදක එල්මෝ ප්‍රනාන්දු හමුවී ඇත. එල්මෝ විසින් ගුවන්විදුලි සංස්ථාවේ පිළිගැනීමේ නිලධාරී කාමරයට ප්‍රේමකීර්තිව කැඳවා ගීතයක් ලියා දෙන ලෙස ඉල්ලා තිබේ. එවේලේ කාර්යබහුලව සිටි ප්‍රේමකීර්ති තම සාක්කුවෙන් කොළ කැබැල්ලක් ගෙන මුල් පද දෙක ලියා දී ඉතිරි කොටස පසුදා ලියා දෙන බවට පොරොන්දු විය. එලෙසින් බිහි වූයේ සිංහල සරල ගීත ඉතිහාසයේ නොමැකෙන සලකුණකි.

"ප්‍රේමකීර්ති ද අල්විස් යනු සාම්ප්‍රදායික නීතිරීතිවලට හෝ දැඩි ශාස්ත්‍රීය රාමු තුළ කොටු වූ ගීත රචකයකු නොවේ. ප්‍රකට ප්‍රවීණ ගීත රචක රත්න ශ්‍රී විජේසිංහයන් වරක් පෙන්වා දුන් පරිදි විචාරකයෝ ඔහු හැඳින්වූයේ 'සිංහල සංගීතයේ අසහාය කවියා' ලෙසිනි. ඔහුට ගීතයක් ලිවීමට නිස්කලංක පරිසරයක් පැය ගණන් හෝ දින ගණන් අවශ්‍ය නොවීය. හිස් සිගරට් පැකට්ටුවක පිටුපස කොළ කැබැල්ලක බස් රථයක ටිකට් පතක වුවද ක්ෂණිකව අතිශය ගැඹුරු පද පෙළ ලිවීමට ඔහුට සහජ හැකියාවක් තිබිණි."



### 'ආදරයේ උල්පත වූ අම්මා...' (වික්ටර් රත්නායක)

ප්‍රේමකීර්ති තම මවට දැඩි සේ ආදරය කළේය. දිනක් මව ඔහුට පැවැසුවේ 'උඹ පත්තරවලට රූකඩවලට, පාරේ යන හැමෝටම සින්දු ලියනවා. හැබැයි මට තාම එක සින්දුවක් ලිව්වේ නැහැනේ' කියාය. එය සිනහවෙන් නිමා කළද වසරකට පසු මව බරපතළ ලෙස රෝගාතුර වී රෝහල්ගත කළ අවස්ථාවේදී තම මවට තමන්ව පවා හඳුනාගත නොහැකි තත්ත්වය දුටු ප්‍රේමකීර්ති මහත් සේ කම්පා විය. මව ජීවතුන් අතර සිටියදීම ඇයට එය ඇසීමට සලස්වන ලෙස ඔහු වික්ටර් රත්නායකගෙන් ඉල්ලා සිටියේය. 'මතු බුදුවන දවසක මගේ අම්මා... රාහුල පුතු වී උපදින්නෙමි මං...' යන පද පෙළ ලියැවුණේ ඒ අසීමිත මාතෘ ප්‍රේමය නිසාය.

### 'තනි තරුවේ...' (වික්ටර් රත්නායක)

වික්ටර් රත්නායක සහ ප්‍රේමකීර්ති කලාවේ පමණක් නොව පෞද්ගලික ජීවිතයේද ඉතා සමීප මිතුරන් වූහ. දිනක් සන්ධ්‍යාවක මිතුරන් සමග මුහුදු වෙරළේ සිටියදී අහසේ එක් තරුවක් පායා ඒම නිරීක්ෂණය කළ ප්‍රේමකීර්ති 'තනි තරුවේ' යනුවෙන් කියමින් එම ගීතය එසැණින් රචනා කළේය. 'සඳට අහස ආදරේ ද', 'තරු අකුරින්', 'ප්‍රේම පාරාදීසේ' වැනි ගීත රැසක් බිහිවූයේ මේ සොඳුරු මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

### 'මේ නගරය මා ඔබ...' (මර්වින් පෙරේරා)

සරසවි පෙම්වතුන් සහ අතීත විරහව මෙතරම් සංවේදීව ලියැවුණු තවත් ගීතයක් සිංහල සාහිත්‍යයේ නැති තරම්ය. මෙය ලියැවෙන්නේද ප්‍රේමකීර්තිගේ පෞද්ගලික අත්දැකීමක් ඇසුරෙනි. අතීතයේ තමන් ආදරය කළ නමුත් දැන් වෙනත් අයකු සතුවී සිටින පෙම්වතියක සහ ඇගේ දරුවා අහම්බෙන් දැකීමෙන් ඇතිවූ කම්පනය මෙම ගීතයට පාදක විය. 'එකම වීදියේ අනෙකෙකු හා යන ඔබ දෙස නොබලා නොදන්නෙකු සේ මා යායුතුය ඉදිරියටම පමණක්...' යන පද පෙළින් ඔහු නිරූපණය කළේ නූතන නාගරික ශිෂ්ටාචාරය තුළ මිනිස් සබඳතාවල ඇති තිත්ත සත්‍යයයි.

ප්‍රේමකීර්ති ද අල්විස් ඝාතනය යනු හුදෙක් එක් පුද්ගලයකුගේ මරණයක් නොව 80 දශකයේ අගභාගයේ ශ්‍රී ලංකාව වෙළාගෙන තිබූ දේශපාලන කුණාටුවේ රාජ්‍ය විරෝධී කැරැල්ලේ සහ භීෂණයේ බියකරු කැඩපතකි.

එකල ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා සමග පැවැති සමීප සබඳතාව මෙන්ම රජයේ මාධ්‍ය ආයතනයක සේවය කරමින් කැරැලිකරුවන් පැනවූ මාධ්‍ය වර්ජන නොතකා රාජකාරියට වාර්තා කිරීම ඔහු ඉලක්කයක් වීමට ප්‍රධාන හේතුවක් විය. එදා හෝමාගම ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අංශය වන 'දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය' විසින් මෙම ඝාතනය සිදුකළ බවට ප්‍රබල චෝදනා එල්ල විය.

1994 මාර්තු 18 වැනිදා කොළඹ මහාධිකරණය නිකුත් කළ තීන්දුවට අනුව ඝාතකයා ලෙස හඳුනාගත් සමන් ප්‍රියංකර ගමගේ නමැත්තාට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම විය. ඒ අවස්ථාවේදී ඔහුගේ වයස අවුරුදු 17ක් වූ අතර පසුව යහපත් කල්ක්‍රියාව හේතුවෙන් වසර 18ක සිරදඬුවමකින් පසු ඔහු නිදහස් විය.

කෙසේ වෙතත් මෙම ඝාතනය පිටුපස ඇති සැබෑ දේශපාලන කුමන්ත්‍රණ සහ පරස්පරතා අදටත් නොවිසඳුණු අබිරහසක් ලෙස පවතී. ප්‍රවීණ මාධ්‍යවේදී ධර්මන් වික්‍රමරත්න මහතාගේ 'ප්‍රේමකීර්ති ඝාතනයේ සුලමුල' ග්‍රන්ථය වැනි ගවේෂණාත්මක කෘති මෙම ඛේදවාචකයේ සැබෑ ගැඹුර සහ සැඟවුණු දේශපාලන කුමන්ත්‍රණ සොයාබැලීමට කරන උත්සාහයන්හි කොටසකි. ඇතැම් පාර්ශ්ව දේශපාලන වාසි තකා සත්‍යය යටපත් කිරීමට තැත් කළද අවසානයේ රටට අහිමි වූයේ ආදේශ කළ නොහැකි මහා ප්‍රඥාවකි.

ප්‍රේමකීර්ති ද අල්විස්ගේ පවුලේ උරුමයද ශෝකජනකය. ඔහුට තම පළමු විවාහයෙන් 'සුරංගි' නම් දියණියක්ද දෙවැනි බිරිඳ වන නිර්මලා ද අල්විස්ට දාව 'පූර්ණ සම්පත්' නම් පුතෙකුද විය. ඔහුගේ භාර්යාව වන නිර්මලා ද අල්විස් මහත්මිය සැමියාගේ මරණයෙන් පසු 'ආදරයේ උල්පත' වැනි ගීත ඇතුළු ගීත රචනා කරමින් ඒ කලා උරුමය රැකගැනීමට වෙහෙසුණාය. එහෙත් 2025 ජූලි 22 වැනිදා ඇයද මෙලොවින් සමුගත්තාය.

ඇය ජීවිතයේ අවසන් කාලය වනතුරුම දැඩිව අවධාරණය කළේ ප්‍රේමකීර්තිව ඝාතනය කළේ ජේවීපී කැරලිකරුවන් නොව, වෙනත් බලගතු දේශපාලන කුමන්ත්‍රණයකින් බවටත්, සිය සැමියාගේ ඝාතනයට සැබෑ සාධාරණය තවමත් ඉටුවී නොමැති බවටත්ය.

**CHAMATH VLOGS**

---

# අවුරුදු එකහමාරට ආණ්ඩුව මොනවද කළේ?

**බොහෝ දෙනා මේ දිනවල කරන චෝදනාවක් වන්නේ පසුගිය අවුරුදු එකහමාරට ආණ්ඩුව කිසිවක් කර නැතැයි කියාය. එම චෝදනාවට අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතා සිය ෆේස්බුක් පිටුවෙන් පිළිතුරු දී තිබුණේ මෙසේය.**




1. රු. මිලියන 3,103ක වටිනාකමක් යුත් හෘද කැතීටකරණ යන්ත්‍ර 16ක් රෝහල් පද්ධතියට ලබාදීම.
2. රාජ්‍ය සේවකයන්ගේ අවම වැටුප රු. 40,000ක් හා පෞද්ගලික රු.30,000 කිරීම.
3. වතු කම්කරු වැටුප රු. 1,750ක් කිරීම.
4. අදියර 3කින් රු. 15,750ක රාජ්‍ය සෙවක වැටුප් වැඩි කිරීම.
5. ඇ.ඩො. බිලියන 5ක විදෙස් ණය ගෙවීම.
6. වසර 18ක් තිස්සේ වන්දි නොගෙවූ ජනතාවට රු. ලක්ෂ 12 බැගින් රු. මිලියන 300ක් ලබාදීම.
7. උමාඔය ප්‍රතිසංස්කරණයට රු. මිලියන 228ක් ලබාදීම.
8. මධ්‍යම අධිවේගී මාර්ගයේ සංවර්ධනයට රු. බිලියන 112ක් ලබාදීම.
9. BESS විදුලි ව්‍යාපෘතියේ බැටරි පද්ධතිය සඳහා රු. බිලියන 40ක් ලබාදීම.
10. ලක්ෂ 500ක් වටිනා නවීන කොම්ටෙක් මල්ටිප්‍රොසීඩියුරල් යන්ත්‍ර 2ක් ගෙන්වා රෝහල් පද්ධතියට එකතු කිරීම.
11. පාසල් 400ක ක්‍රීඩා පිටි ප්‍රතිසංස්කරණය සඳහා රු. මිලියන 2010.5ක් ලබාදීම.
12. රු. බිලියන 13.4ක් යොදවා ගන්දර ධීවර වරාය සංවර්ධනය කිරීම.
13. කොළොන්නාව ගංවතුර සඳහා ස්ථිර විසඳුමක් ලෙස එම ව්‍යාපෘතියට රු. බිලියන 1ක් ලබාදීම.
14. රුවන්වැල්ල ජල ගැටලුවට රු. මිලියන 2,147ක් ලබාදීම.
15. දඹුල්ල රෝහල ජාතික රෝහලක් කිරීමට රු. බිලියන 7ක මුදල් ලබාදීම.
16. පියයුරු පිළිකා හඳුනා ගන්නා මැමොග්‍රැෆි යන්ත්‍ර 7ක් සඳහා රු. මිලියන 765ක් ලබාදීම (දැනටම යන්ත්‍ර 5ක් රටට ගෙනැවිත් අවසානයි).
17. අධිවේගී මාර්ගයට අවශ්‍ය බස්රථ 200කට මුදල් ලබාදීම.
18. හල්දුම්මුල්ල නිවාස 23කට රු. ලක්ෂ 648ක් වෙන්කිරීම (අධිඅවදානම් කියලා මිනිසු ඉවත් කළේ 2014. නමුත් නව ස්ථානයක ගෙවල් හදන්නේ අනුරගේ ආණ්ඩුව).
19. මෙගාවොට් 150ක කොන්ඩච්චි සුළං විදුලි ව්‍යාපෘතිය අරම්භ කිරීම.
20. දේශයේ ප්‍රථම උපප්‍රජනන ඒකකයක් කරාපිටියේ ස්ථාපනය කිරීම.
21. වනජීවී දෙපාර්තමේන්තුවට ඩබල් කැබ් 16ක්, සිංගල් ඩෝ කැබ් 84ක්, ට්‍රැක්ටර් 09ක් ලබාදීම.
22. අනුරාධපුර රෝහල ජාතික රෝහලක් කිරීමට රු. බිලියන 20ක් ලබාදීම.
23. යාපනය පුස්තකාලය සංවර්ධනයට රු. මිලියන 100ක් ලබාදීම.
24. අම්පාර බහුකාර්ය නගරශාලා ව්‍යාපෘතිය සඳහා රු. බිලියන 1.75ක් ලබාදීම.
25. උතුරු පොල් ත්‍රිකෝණය ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 500ක මුදල් ලබාදීම.
26. 2019දී මාතර ලවණ බාධකය නිසා වගා හානියට පත්වූ ගොවීන්ට මිලියන 1,200ක වන්දි ලබාදීම (2019 ඉඳලා පොල් ගාපු ආණ්ඩු).
27. සාම්පූර් සුළං විදුලි බලාගාරය සංවර්ධනය ආරම්භ කිරීම.
28. ලෝකයේ දියුණුම තාක්ෂණයක් වන සෝලාර් පවර් විදුලිය ගබඩා කිරීමට ස්ථාන 16ක බැටරි පද්ධති ස්ථාපනය කිරීම.

- මන්ත්‍රී වරප්‍රසාද විශ්‍රාම වැටුප් අහෝසි කිරීම
- ඇමැති බංගලා ජනතා සේවයට යෙදවීම
- ජනාධිපති වරප්‍රසාද අහෝසි කිරීම
- වාහන පර්මිට් ඉවත් කිරීම
- පාර්ලිමේන්තු කැන්ටිමේ පිනට කෑම නතර කිරීම